සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv.Level), Grade 12, Year End Test, July 2019**

**ව්‍යාපාර අධ්‍යයනය - I**

**Business Studies - I**

32 S I

පැය 02 යි

Time: 02 hours

විභාග අංකය : .........................................

- ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

01. ව්‍යාපාර විකාශනයේ විවිධ අදියර හා එම අදියර සමඟ බැඳුණු සුවිශේෂ සිදුවීම් පහත වගුවේ දක්වේ.

| අදියර | සිදුවීම් |
|---|---|
| 1. ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය | A - උපකාරක සේවාවල ආරම්භය |
| 2. භාණ්ඩ හුවමාරුව | B - මහා පරිමාණ නිෂ්පාදනය |
| 3. මුදල් භාවිතය | C - ඍජු නිෂ්පාදනය |
| 4. කාර්මික විප්ලවය | D - වෙළඳාමේ ආරම්භය |

ඉහත එක් එක් අදියරට ගැළපෙන සිදුවීම් දක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) 1A, 2C, 3B, 4D
(2) 1B, 2D, 3C, 4A
(3) 1C, 2A, 3B, 4D
(4) 1D, 2A, 3C, 4B
(5) 1C, 2D, 3A, 4B (......................)

02. පහත වගුවේ ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශව කිහිපයක් හා ඔවුන් ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු කිහිපයක් දක්වා ඇත.

| ඇල්මැති පාර්ශවය | | ඇල්මක් දක්මට හේතු |
|---|---|---|
| 1. අයිතිකරුවන් | A | ආර්ථික සංවර්ධනය |
| 2. කළමනාකරුවන් | B | රැකියා අවස්ථා |
| 3. රජය | C | අලෙවි උපාය මාර්ග |
| 4. ප්‍රජාව | D | ලාභය |
| 5. තරගකරුවන් | E | තීරණවල සාර්ථක බව |

ඇල්මැති පාර්ශවයන් හා ඔවුන් එසේ ඇල්මක් දක්වීමට හේතු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) 1A, 2B, 3C, 4D, 5E
(2) 1A, 2C, 3B, 4D, 5E
(3) 1D, 2E, 3A, 4B, 5C
(4) 1D, 2C, 3B, 4A, 5E
(5) 1E, 2D, 3A, 4B, 5C (......................)

03. සාර්ව පරිසරයේ ප්‍රධාන සංරචකයක් වන ''ප්‍රජා පරිසරයට අයත් සාධක ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) ජනගහනය, මිළ මට්ටම්, ගෘහ රටාව, ජන වර්ගය
(2) ජනගහනය, ජනගහන වර්ධන වේගය, උද්ධමනය, චාරිත්‍ර වාරිත්‍ර
(3) ජනගහනය, ජනගහන වර්ධන අනුපාතය, අධ්‍යාපන මට්ටම, ස්ත්‍රී පුරුෂභාවය
(4) ජනගහනය, වයස් ව්‍යුහය, ස්ත්‍රී පුරුෂබව, සිරිත් විරිත්
(5) ජනගහනය, දළ ජාතික නිෂ්පාදිතය, ජන වර්ගය, ගෘහ රටාව (......................)

04. ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික යන නිෂ්පාදිත අනුපිළිවෙළින් දැක්වෙන්නේ,

(1) ධීවර, පතල්/ගොවිපල, ඉදිකිරීම්/වෙළඳාම, පුද්ගල, සේවා
(2) ගොවිපල, ධීවර/කැනීම්, ඉදිකිරීම්/වෙළඳාම, සන්නිවේදනය
(3) ගොවිපල, කැනීම් කටයුතු/ගැලපුම්, ඉදිකිරීම්/වානිජ්‍යය, උපකාරක සේවා
(4) ධීවර, පතල් හා කැනීම්/නිෂ්පාදන, ඉදිකිරීම් / උපකාරක සේවා, වෙළඳාම
(5) ගොවිපල, ඉදිකිරීම්/නිෂ්පාදන, විදුලිය / සන්නිවේදනය, ප්‍රවාහනය (......................)

05. විවිධ පාර්ශව ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට බලපාන හේතූන් කිහිපයක් පහත දැක්වේ.

A - වෙළඳපල කොටස
B - ලාභය
C - ඉහළ වැටුප්
D - ගත් තීරණවල සාර්ථක බව
E - ව්‍යාපාරික වර්ධනය
F - ප්‍රසාද දීමනා
G - රැකියාවේ ස්ථිර බව
H - රැකියා උසස් වීම්

ඉහත හේතු අතුරින් සේවකයන් පමණක් ව්‍යාපාරය කෙරෙහි උනන්දුව දක්වන හේතූන් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A C D E (2) B C E G (3) C F G H (4) C D E H
(5) B F G H (......................)

06. ව්‍යාපාරයක් සමාජ වගකීම් ඉටු කළ යුතු පාර්ශව හා ඊට අදාළ කාර්යයන් පිළිවෙලින් පහත වගුවේ දැක්වේ.

| වගකීම් ඉටුකළ යුතු පාර්ශව | කාර්යයන් |
|---|---|
| A සමාජය | 1. සාධාරණවීම |
| B සේවකයන් | 2. සාධාරණ ඉපයීම |
| C අයිතිකරුවන් | 3. හරිත නිෂ්පාදන |
| D ගනුදෙනුකරුවන් | 4. සමානාත්මතාව |

සමාජ වගකීම් ඉටුකළ යුතු පාර්ශවයන් ඊට අදාළ කාර්යයන් නිවැරදිව ගැලපූ විට නිවැරදි යුගල කාණ්ඩය කුමක් ද?

(1) A - 1, B - 2, C - 3, D - 4 (2) A - 4, B - 3, C - 2, D - 1
(3) A - 3, B - 4, C - 2 D - 1 (4) A - 2, B - 3, C - 1, D - 4
(5) A - 3, B - 2, C - 4, D - 1 (......................)

07. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියේ ඇතුළත් නොවන වගන්තිය තෝරන්න.

(1) හවුල්කරුවන් සියලු දෙනාගේම එකඟතාවය නොමැතිව නව හවුල්කරුවකු බඳවා ගැනීමට නොහැකිවීම.
(2) හවුල්කරුවන් කළමනාකරණ කටයුතුවලට සහභාගිවීම හා සියලු හවුල්කරුවන් ඒ වෙනුවෙන් පාරිශ්‍රමිකයක් ලැබිය හැකි බව.
(3) ප්‍රාග්ධනයට සමානව දායක විය යුතු අතර ලාභ අලාභ සමව බෙදා ගත යුතුය.
(4) ව්‍යාපාරයේ සියලු ගිණුම් පොත් ප්‍රධාන කාර්යාලයේ තිබිය යුතු අතර සෑම හවුල්කරුවකුටම ඒවා පරීක්ෂා කළ හැකිය.
(5) යෙදූ ප්‍රාග්ධනය වෙනුවෙන් පොලී ලැබීමට හිමිකමක් නැත.

08. පහත සඳහන් කාණ්ඩ අතුරෙන් වක්‍ර බදු පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) ආදායම් බද්ද සහ එකතු කළ අගය මත බද්ද (2) එකතු කළ අගය මත බද්ද සහ ප්‍රාග්ධන ලාභ බද්ද
(3) ප්‍රග්ධන ලාභ බද්ද සහ රේගු බද්ද (4) රේගු බද්ද සහ නිෂ්පාදන බද්ද
(5) දේශීය භාණ්ඩ බද්ද සහ සමාගම් බද්ද (......................)

09. පහත සඳහන් වරණ අතුරින් පාරිභෝගික වගකීම් තුනක් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ආරක්ෂාව සලසා ගැනීම, තොරතුරු දැන ගැනීම, තෝරා ගැනීම
(2) විචාරාත්මක දැනුවත්භාවය, ආරක්ෂාව සලසා ගැනීම වන්දි ලබා ගැනීම
(3) තෝරා ගැනීම, වන්දි ලබා ගැනීම, සමාජය ගැන සැලකිලිමත්වීම.
(4) ආරක්ෂාව සලසා ගැනීම, තොරතුරු දැනුවත් බව සමාජය ගැන සැලකිලිමත්වීම
(5) සහයෝගිතාව, විචාරාත්මක දැනුවත් බව සමාජය ගැන සැළකිලිමත්වීම. (......................)

10. පහත දැක්වෙන්නේ විවිධ ව්‍යාපාර වර්ගවල වාසි කිහිපයකි.
A - වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වේ.
B - කළමනාකරණ තීරණ අයිතිකරු විසින් ගනී.
C - වගකීම කිහිපදෙනෙකු අතර බෙදීයාම
D - ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යබව ආරක්ෂාවීම.
E - ව්‍යාපාර කළමනාකරණ දක්ෂතා ඇති අය බඳවාගත හැකිවීම
F - සියළු ලාභ අයතිකරු සතුවීම.
මේ අතුරින් හවුල් ව්‍යාපාරයකින් ලැබෙන වාසි පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) ADF (2) ACE (3) ABC (4) ADE
(5) DEF (......................)

11. පහත සඳහන් දේ අතුරින් වරලත් හිමියා විසින් වරලත්ලාභියා වෙත සපයනු නොලබන පහසුකම කුමක් ද?
(1) තාක්‍ෂණ සහයදීම
(2) ඕනෑම සැපයුම්කරුවකුගෙන් භාණ්ඩ මිලදී ගැනීමට අවසර දීම
(3) සිය වෙළඳනාමය භාවිතයට අවසර දීම
(4) මූල්‍ය පහසුකම් ලබාදීම
(5) අලෙවිකරණ සහාය ලබාදීම (......................)

12. ව්‍යාපාර සංයෝජනයක් යනු,
(1) සමාගමක් විසින් තවත් සමාගමක් අත්පත් කරගැනීමයි.
(2) රජයට හිමි රජයේ පාලනය යටතේ වූ ව්‍යාපාරයකි.
(3) සමාගමක් බහුජාතික සමාගමක් බවට පරිවර්තනය කිරීමයි.
(4) සමාගම් දෙකක් හෝ කිහිපයක් එකට එකතු වී කටයුතු කිරීමයි.
(5) පවත්නා ව්‍යාපාරයක නම සන්නම හා වෙළඳක්‍රම භාවිතා කිරීමයි (......................)

13. මානසික තෘප්තිය, පිළිගැනීම, ප්‍රශංසාව, පරෝපකාරය යනාදී ප්‍රතිලාභ අපේක්ෂාවෙන් කටයුතු කරන්නේ
(1) අභ්‍යන්තර ව්‍යවසායකයාය. (2) හරිත ව්‍යවසායකයාය
(3) සමාජයීය ව්‍යවසායකයාය (4) ගෝලීය ව්‍යවසායකයාය.
(5) කාන්තා ව්‍යවසායකයාය (......................)

14. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට පමණක් ආවේණික ලක්ෂණයක් නොවන්නේ,
(1) සේවක සංඛ්‍යාව අඩුවීම (2) නවීන තාක්ෂණය වැඩිපුර භාවිතා කිරීම
(3) පවුලේ ශ්‍රමය වැඩිවශයෙන් භාවිතාකිරීම (4) තමන් සතු තොරතුරු මත පමණක් තීරණ ගැනීම
(5) වෙළඳපොල කුඩාවීම (......................)

15. පහත දැක්වෙන්නේ කුඩා ව්‍යාපාර හඳුනාගැනීම සඳහා විවිධ ආයතන විසින් භාවිතා කරනු ලබන නිර්නායක කිහිපයකි.

| | ආයතනය | | නිර්නායකය |
|---|---|---|---|
| A | ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 1. | ආයෝජිත ප්‍රාග්ධනය රු. මිලි. 20ට අඩු ව්‍යාපාර |
| B | කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | 2. | ආයෝජිත ප්‍රාග්ධනය රු. මිලි. 4ට අඩු ව්‍යාපාර |
| C | ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව | 3. | ස්ථිර සේවක සංඛ්‍යාව 50ට අඩු ව්‍යාපාර |
| D | කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 4. | සේවක සංඛ්‍යාව 25ට අඩු ව්‍යාපාර |

ඉහත ආයතන නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,
(1) A - 1, B - 4, C - 3, D - 2 (2) A - 3, B - 2, C - 4, D - 1
(3) A - 2, B - 3, C - 1, D - 4 (4) A - 4, B - 2, C - 3, D - 1
(5) A - 1, B - 2, C - 4, D - 3 (......................)

16. කාංචනා තම මාසික වැටුපෙන් රු 3000/- වටිනා සාරියක් ද, රු 2000/-ක් වටිනා අත් බෑගයක් ද මිලට ගෙන තම මිතුරියකගෙන් ලබාගෙන තිබූ රු 6000/- ණය මුදලක් ද ආපසු ගෙවන ලදී. ඉතිරි මුදල බැංකුවේ තැන්පත් කරන ලදී. මෙම සිද්ධියට අනුව මුදලින් ඉටු වූ කාර්යයන් අනුපිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම, වටිනාකමේ මිම්මක් වීම, හුවමාරු මාධ්‍යයක් වීම, වටිනාකමේ සන්නිධියක් වීම

(2) වටිනාකමේ මිම්මක් වීම, විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම, හුවමාරු මාධ්‍යයක් වීම, වටිනාකමේ සන්නිධියක් වීම.

(3) වටිනාකමේ මිම්මක් වීම, හුවමාරු මාධ්‍යයක් වීම, විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම, වටිනාකමේ සන්නිධියක් වීම

(4) වටිනාකමේ සන්නිධියක් වීම, විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම, හුවමාරු මාධ්‍යයක් වීම, වටිනාකමේ මිම්මක් වීම

(5) වටිනාකමේ මිම්මක් වීම, වටිනාකමේ සන්නිධියක් වීම, හුවමාරු මාධ්‍යයක් වීම, විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම

(......................)

17. මහජන බැංකුවේ ගිණුමක් හිමි අසංකා තම ගිණුමෙන් රු 25000 /- වටිනා චෙක්පතක් ප්‍රියංකාට නිකුත් කරන ලදී. ප්‍රියංකා එම චෙක්පත තම ඉතිරිකිරීමේ ගිණුම ඇති සම්පත් බැංකුවේ තැන්පත් කරන ලදී. මෙම ගණුදෙනුවේ අණකරු, ආදායකයා හා අණලද්දා පිළිවෙළින් දක්වෙන්නේ,

(1) ප්‍රියංකා, මහජන බැංකුව, අසංකා

(2) අසංකා, මහජන බැංකුව, සම්පත් බැංකුව

(3) සම්පත් බැංකුව, ප්‍රියංකා, අසංකා

(4) අසංකා, ප්‍රියංකා, මහජන බැංකුව

(5) අසංකා, ප්‍රියංකා, සම්පත් බැංකුව

(......................)

18. ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයක් ලෙස පමණක් සැලකිය හැකි වන්නේ පහත ඒවායින් කවරක් ද?

A - ව්‍යවහාර මුදල් නිකුත් කිරීම

B - විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙහෙයවීම

C - මිල ක්‍රමයේ ස්ථායිතාවය ඇති කිරීම

D - බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවල අධීක්ෂක ලෙස කටයුතු කිරීම

E - ආර්ථික හා මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය ඇති කිරීම

F - මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීම

(1) A, C, D, E (2) A, B, D, F (3) B, C, E, F (4) A, B, E, F

(5) A, D, E, F

(......................)

19. මුදල් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරින් එකක් පමණක් වැරදිය. එය කුමක්ද?

(1) අන්තර්ජාලය මගින් සිදු කරන ගණුදෙනු වල දී ගෙවීම් සඳහා යොදා ගන්නා මෘදුකාංග විශේෂය ජාල මුදල්ය.

(2) ආසන්න මුදල් 100% ද්‍රවශීලතාවයකින් යුක්ත වන අතර හරපත් හා ණයපත් ආසන්න මුදල් ලෙස ගත හැකිය.

(3) බැංකුවල ඇති ගණුදෙනුකරුවන්ගේ ඉල්ලුම් තැන්පතු බැංකු මුදල් ලෙස හැඳින්වේ.

(4) මුදලකින් ඉටුකරන කාර්ය ඉටුකිරීමට ව්‍යවහාර මුදල් වෙනුවට භාවිතා කරන භෞතික නොවන මුදල් ගම්‍ය මුදල් වේ.

(5) නියෝග මුදල් හා සසඳන කල ණය මුදල් වල වෙනස්කමක් වනුයේ එහි යම් ප්‍රමාණයක අවදානමක් පැවතීමයි.

(......................)

20. පහත සඳහන් අවදානම් අතරින් රක්ෂණය කළ නොහැකි අවදානම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

A - ගංවතුරින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී ගොවිතැනට හානිවීමෙන් ගොවීන්ට විශාල වශයෙන් පාඩු සිදුවීම.

B - රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන ගබඩාවක රසායන ද්‍රව්‍ය වාෂ්පවීම නිසා පාඩු සිදුවීම

C - ලබන වසරේ උසස් පෙළ විභාගයට පෙනී සිටීමට නියමිත සිසුන්ට සරසවි වරම් අහිමිවීමේ අවදානම

D - සුමේධට තම ජීවිතය හා බිරිඳගේ ජීවිතය පිළිබඳ අවදානම

E - කාංචනගේ ව්‍යාපාරයට සොරු ඇතුළු වී මුදල් හා වෙනත් දේ ගෙනයාමේ අවදානම

F - සුරංගගේ ව්‍යාපාරයේ ණයගැතියකු වන අසංකගෙන් අයවියයුතු මුදල් නොලැබීමේ අවදානම

G - මහේෂා විසින් මිළදී ගත් ලොතරැයිපතකට දිනුමක් නොලැබීමේ අවදානම

H - අලුත් ව්‍යාපාරයක් වෙළඳපොලට පැමිණීම හේතුවෙන් වින්සන් සමාගමට තම වෙළඳපොල කොටස අහිමිවීමේ අවදානම

(1) A, C, E, F (2) D, E, F, G (3) A, B, C, G (4) B, C, G, H

(5) B, C, E, F

(......................)

21. රක්‍ෂණය සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - එකම අවදානමක් රක්‍ෂණ ආයතන කිහිපයක රක්‍ෂණය කර තිබේනම් දේපල රක්‍ෂණයේ දී දායකත්ව මූලධර්මය අදාල වේ.

B - රක්‍ෂණ හිමිකම යටතේ රක්‍ෂිතයා හා දේපල අතර සම්බිධතාව නීතිමය වශයෙන් ඔප්පු කිරීමක් අවශ්‍ය නොවේ.

C - ප්‍රතිරක්ෂණය හේතුවෙන් රක්‍ෂිතයාට ලැබෙන සුරක්ෂිතතාව මත රක්‍ෂිතයාගේ වාරික මුදල් අඩුවීමක් සිදුවිය හැකිය.

D - ජීවිත රක්‍ෂණයක් ලබා ගැනීමේ මූලිකම අරමුණ අනාගතය සඳහා මුදල් ඉතිරි කිරීමයි.

E - ඇගයූ ඔප්පුව, විවෘත ඔප්පුව, අනාගත ආවරණ ඔප්පුව නැව්බඩු ඔප්පු වර්ග කිහිපයකි.

F - රක්‍ෂණ ගිවිසුම යනු කිසියම් දේපලකට හෝ ජීවිතයකට අදාළව රක්‍ෂණ සමාගම විසින් රක්‍ෂිතයාට දෙනු ලබන ලිඛිත සහතිකයයි.

මේවා අතුරින් නිවැරදි ප්‍රකාශ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A B E (2) B D E (3) A C E (4) D E F
(5) C D F (......................)

22. අසේලගේ මෝටර් රථයේ වෙළඳපොළ වටිනාකම රු ලක්ෂ 50ක් වන අතර මෝටර් රථය සඳහා ලක්ෂ 40 විස්තීරණ රක්‍ෂණ ඔප්පුවක් ලබාගෙන තිබුණි. මෝටර් රථයට අනතුරකින් සිදු වූ හානිය රු ලක්‍ෂ 5ක් ලෙස තක්සේරු කරන ලදී. රක්‍ෂණ සමාගම අසේලට වන්දි වශයෙන් ගෙවනුයේ,

(1) රු 400, 0000 (2) රු 400,000 (3) රු 500,000 (4) රු 250,000
(5) වන්දි හිමි නොවේ. (......................)

23. පහත දැක්වෙන කරුණුවලින් වාචික සන්නිවේදන ක්‍රමයක වාසියක් ලෙස ගත නොහැකි කරුණ වන්නේ,

(1) තොරතුරු සන්නිවේදනය කල බවට සාක්ෂියක් තිබීම.
(2) පණිවුඩදීම හා ඊට ලැබෙන ප්‍රතිචාර ක්‍ෂණිකව දැනගත හැකිවීම.
(3) පණිවුඩය ලබන්නාගේ ස්වභාවය හා ඔහු සිටින පරිසරය අනුව පණිවුඩය ඉදිරිපත් කළ හැකිවීම
(4) ඉරියව් හා හැඟීම් භාවිත කරමින් වඩාත් ප්‍රබලම පණිවුඩය ලබාදිය හැකිවීම
(5) සංකීර්ණ හා විස්තරාත්මත පණිවුඩයක් ලබා දීමට නම්‍යශීලීභාවයෙන් යුක්ත වීම. (......................)

24. ගාස්තු ගෙවා අන්තර්ජාල පහසුකම් සපයන ආයතන හඳුන්වනුයේ,

(1) විද්‍යුත් ව්‍යාපාර (2) සයිබර් අවන්හල් (3) ලෝක ව්‍යාප්ත වෙබ් අඩවි (4) කුරියර් සේවය
(5) ටෙලි කොමියුනිකේෂන් සෙන්ටර් (......................)

25. පහත වගුවේ දැක්වෙන්නේ ප්‍රවාහනයේ මූලිකාංග හා ඒවාට අදාළ නිදසුන් කිහිපයකි.

| | මූලිකාංග | | නිදසුන් |
|---|---|---|---|
| A | මාර්ගය | 1. | ගංගා |
| B | මාධ්‍යය | 2. | බස් නැවතුම |
| C | බලය | 3. | ජෙට් යානය |
| D | පර්යන්තය | 4. | විදුලිය |
| | | 5. | වෑන් රථ |
| | | 6. | ගුවන් තොටුපල |
| | | 7. | ඩීසල් |
| | | 8. | උමග |

මූලිකාංග නිදසුන් හා ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A - 1 හා 2, B - 3 හා 4, C - 5 හා 6, D - 7 හා 8 (2) A - 2 හා 5, B - 1 හා 4, C - 3 හා 6, D - 7 හා 8
(3) A - 1 හා 8, B - 3 හා 5, C - 4 හා 7, D - 2 හා 6 (4) A - 2 හා 7, B - 1 හා 4, C - 3 හා 8, D - 5 හා 6
(5) A - 1 හා 8, B - 2 හා 5, C - 4 හා 7, D - 3 හා 6 (......................)

26. ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී බලපාන සාධක ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) ආරක්ෂාව/ සුලභතාව / බලය / වේගය (2) ධාරිතාව / සුලභතාව / මාර්ගය / වේගය
(3) පිරිවැය / ආරක්ෂාව / ධාරිතාව / බලය (4) ආරක්ෂාව / වේගය / මාර්ගය / ධාරිතාවය
(5) ධාරිතාවය / පිරිවැය / ආරක්ෂාව / වේගය (......................)

27. නැව්ගත කරන ලද භාණ්ඩ තොගයක් අපනයනය කරන රටේම නිපදවා ඇති බවට පිළිගත් වෙළඳ මණ්ඩලයක් නිකුත් කරන ලියවිල්ල වන්නේ,

(1) ආනයන සටහන්කරය (2) නෞභාරපත
(3) ඉන්ඩෙන්ටුව (4) ප්‍රභවස්ථාන සහතිකය
(5) සනීපාරක්ෂන සහතිකය (......................)

28. ප්‍රධානියා වෙනුවෙන් කටයුතු කිරීමට අසීමිත බලයක් ඇති නියෝජිතයා,

(1) කොමිස් නියෝජිතයා (2) සාධ්‍යකයා
(3) තැරැව්කරු (4) කැපකරු නියෝජිතයා
(5) වෙන්දේසිකරු (......................)

29. විද්‍යුත් සිල්ලර වෙළඳාමෙන් නොලැබෙන එහෙත් සාම්ප්‍රදායික සිල්ලර වෙළඳාමෙන් ලැබෙන වාසියකි.

(1) මිලට ගැනීමේ තීරණය ගැනුම්කරු විසින්ම පාලනය කිරීම
(2) භෞතිකව භාණ්ඩ පරීක්ෂා කර බැලීම
(3) නිවසේ සිටම ගනුදෙනුව කළහැකිවීම
(4) තොරතුරු ලබාගැනීමේ පහසුව
(5) මිළ හා වෙනත් පිරිවැය අඩුවීම. (......................)

30. GSP + ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව භාණ්ඩ අපනයනය කරන වෙළඳ කලාපය කුමක් ද?

(1) උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ සංගමය (2) ආසියානු පැසිපික් නිදහස් වෙළඳ සංගමය
(3) රටවල් අටේ කණ්ඩායම (4) අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය
(5) යුරෝපා සංගමය (......................)

අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

31. (අ) ඍජු නිෂ්පාදනය තුළින් .................................................... ඇතිවන අතර පුද්ගල විශේෂීකරණයේ ප්‍රතිඵලයක් ලෙස .................................................... ඇතිවේ.

(ආ) ව්‍යාපාරයේ භාණ්ඩ හා සේවා මිළට ගන්නන් .................................................... නම් වන අතර ව්‍යාපාර ඉදිරිපත් කරන භාණ්ඩ හෝ සේවාවලට සමාන නිෂ්පාදිත ඉදිරිපත් කරන වෙනත් ව්‍යාපාර .................................................... වේ.

32. (අ) ලාභ ලබා ගැනීමට අමතරව ව්‍යාපාරය හා සම්බන්ධ සියලුම උනන්දුවක් දක්වන පාර්ශවයන්ට උපරිම සාධාරණයක් වන පරිදි කටයුතු කිරීම.................................................... ලෙස හැඳින්වෙන අතර තමන් සමග කටයුතු කරන සියලු පාර්ශවයන්ට යහපතක් සිදුවන ආකාරයට කටයුතු කිරීම.................................................... ලෙස හැඳින්වේ.

(ආ) අයිතිකරුවන්ගේ සමාජයීය වගකීම් ආරක්ෂා කිරීමේ දී ඔවුන්ට .................................................... අත්කර දීමත් ගනුදෙනුකරුවන්ට .................................................... ලබාදීමත් සිදුවිය යුතුය.

33. (අ) ''පරිසරය සුරැකීම රජයේ ද වගකීමකි.'' මේ සඳහා පිහිටුවා ඇති රාජ්‍ය ආයතනය .................................................... වන අතර ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ සුරක්ෂිත කරන ආයතනය වන්නේ .................................................... යි.

(ආ) තිරසර සංවර්ධනයේ දී සැලකිල්ල යොමු කරන ක්ෂේත්‍ර ලෙස ...................................................., ...................................................., .................................................... දැක්විය හැක.

34. (අ) එක සමාන ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින සමාගම් දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ වීම .................................................... ලෙස හඳුන්වන අතර කිසියම් නිෂ්පාදිතයක විවිධ අවස්ථාවල යෙදී සිටින සමාගම් කිහිපයක් ඒකාබද්ධ වීම .................................................... නම් වේ.

(ආ) ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවා ඇති නමුත් ලංකාවෙන් පිටත සංස්ථාපනය කර ඇති සමාගමක් .................................................... නම් වන අතර යම් රටක සමාගමක් ලෙස සංස්ථාපනය කර එම රටින් පිටත ව්‍යාපාරික කටයුතු සිදුකරන සමාගම් .................................................... නමින් හඳුන්වයි.

35. (අ) ව්‍යවසායකයෙකු වශයෙන් කටයුතු කිරීමේ දී, ව්‍යවසායකයා ඔහුගේ ව්‍යාපාරය තුළ අයිතිකරු .................................................... සහ .................................................... යන භූමිකාවල නිරත වේ.

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනාගැනීම සඳහා භාවිතා කරන නිර්ණායක ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි අතර ආයතනයක සේවක සංඛ්‍යාව .................................................... නිර්ණායකයක් වන අතර ව්‍යාපාර කටයුත්තේ ස්වභාවය .................................................... නිර්ණායකයකි.

36. (අ) ලංකා සෙට්ල් පද්ධතිය ලෙස හැඳින්වෙනුයේ ................................................... හා ...................................................
යන පද්ධති එකතු කිරීමෙනි.

(ආ) චෙක්පත්වලට රේඛණ යෙදිය හැකි පාර්ශව වන්නේ ...................................................., ...................................................
සහ ................................................... ය.

37. (අ) රක්ෂණ මූලධර්ම අතරින් ජීවිත රක්ෂණයට බලනොපාන මූලධර්ම ලෙස ..................................................., ..................
.................................... සැලකේ.

(ආ) අන්තර්ජාලය පදනම් කර ගනිමින් ව්‍යාපාර ආයතනය තුළ ඇති දත්තවලට ලඟාවීමට සලසා ඇති ආයතනමය ජාලය ................................................... වන අතර දුරකථන ජාලයක් ආශ්‍රයෙන් ආයතනය තුළ තොරතුරු හුවමාරු කර ගැනීමට ස්ථාපනය කරගනු ලැබූ දුරකථන ජාලය ................................................... ලෙස හැඳින්වේ.

38. (අ) ඉදිරි වසර කිහිපය ඇතුළත ශ්‍රී ලංකාවේ සැහැල්ලු දුම්රිය ප්‍රවාහන සේවාවන් ක්‍රියාත්මක වන්නේ ..............................
....................................... සිට ............................................. දක්වාය.

(ආ) ශ්‍රී ලංකවේ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ E 01 .......................................................................
E 02..................................................................... හා E 03 ........................................................................ ලෙසත්
සංකේත අක්ෂරවලින් හා අංකවලින් දක්වා ඇත.

39. (අ) විදේශ වෙළඳාමේ ප්‍රභේද ........................................., ........................................., .........................................,
..............................................., වශයෙන් හැඳින්විය හැකිය.

(ආ) වෙළඳාමේ දී සම්බන්ධ වන අතරමැදියන් ..............................................., ...............................................,
..............................................., ලෙස දැක්විය හැකිය.

40. පහත වගන්ති සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

(1) කේවල ස්වාමි ව්‍යාපාර 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ. (..................)

(2) නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය යනු වාණිජ බැංකු හා ප්‍රාථමික වෙළඳුන් අතිරික්ත අරමුදල් රජයේ සුරැකුම්පත් වල ආයෝජනයේ දී ගෙවනු ලබන පොළී අනුපාතිකයයි. (..................)

(3) සමාගම්වල කොටස් නිකුත් කිරීම, කළමනාකරණය කොටස් ප්‍රාරක්ෂණය හා ඒවා මිළට ගැනීම බලපත්‍ර ලාභී විශේෂිත බැංකුවල කාර්යයක් නොවේ. (..................)

(4) ප්‍රවාහනය මානව සම්බන්ධතා ඇතිකර ගැනීමට මෙන්ම පුද්ගල සංවර්ධනය ඇතිකර ගැනීමට උපකාරී වේ. (..................)

- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. ව්‍යාපාර ක්‍රියාවලියට අයත් කාර්ය හතරක් නම් කරන්න.

(1) ................................................... (2) ...................................................
(3) ................................................... (4) ...................................................

42. ව්‍යාපාර ආසන්න පරිසරයට අයත් සාධක 4ක් නම් කරන්න.

(1) ................................................... (2) ...................................................
(3) ................................................... (4) ...................................................

43. ව්‍යාපාරයක් ආර්ථික තිරසරබව වෙනුවෙන් කටයුතු කරන විට අවධානය යොමු කළ යුතු කරුණු මොනවා ද?

(1) ................................................... (2) ...................................................
(3) ................................................... (4) ...................................................

44. රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාරවලට දායක විය හැකි ආකාර 4ක් සඳහන් කරන්න.

(1) ................................................... (2) ...................................................
(3) ................................................... (4) ...................................................

45. ව්‍යාපාර සංවිධාන අතර හවුල් ව්‍යාපාරයක් තුළ අනිවාර්යයෙන් තිබිය යුතු ලක්ෂණ 4 වන්නේ,

(1) ................................................... (2) ...................................................
(3) ................................................... (4) ...................................................

46. ව්‍යවසායකත්වය තුළින් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ 4ක් ලියන්න.

(1) ....................................................  (2) ....................................................

(3) ....................................................  (4) ....................................................

47. ණයපත හා සම්බන්ධ පාර්ශව 4 නම් කරන්න.

(1) ....................................................  (2) ....................................................

(3) ....................................................  (4) ....................................................

48. ජීවිත රක්ෂණ වාරිකය තීරණය කිරීමේ දී සලකා බලනු ලබන කරුණු මොනවාද?

(1) ....................................................  (2) ....................................................


(3) ....................................................  (4) ....................................................

49. විදේශ වෙළඳාමට බාධාවන තීරුබදු නොවන බාධා 4ක් ලියන්න.

(1) ....................................................  (2) ....................................................

(3) ....................................................  (4) ....................................................

50. පහත රූප සටහන්වලට ගැළපෙන පිළිතුර ලියන්න.

1.  ........................................................................................................................

2.  ........................................................................................................................

3. 

........................................................................................................................

4.  ........................................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv.Level), Grade 12, Year End Test, July 2019**

**ව්‍යාපාර අධ්‍යයනය - II**
**Business Studies - II**

32 | S | II

**පැය 03යි. මිනි. 10යි.**
**Time: 03.10 hours**

විභාග අංකය : ......................................

- (අ) කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද (ආ) කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද වන සේ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

**(අ) කොටස**

01. (i) චතුර තමා පදිංචි ප්‍රදේශයේ පාසල අසල පොත් හා ලිපිද්‍රව්‍ය අලෙවිකිරීම සඳහා පොත් හලක් විවෘත කළේ තම ප්‍රදේශයේ පවතින අඩු පාඩුවක් පිරිමසාලීමේ අදහසිනි. ඔහුගේ ප්‍රධානම අරමුණ මෙම ව්‍යාපාරය තව තවත් වැඩි දියුණු කර ලාභ උපයන ව්‍යාපාරයක් බවට පත් කිරීමයි. එසේ නොවුනහොත් එය ව්‍යාපාරයක් නොවන බව ද ඔහු සිය මිතුරන් සමග පවසා ඇත. ව්‍යාපාරයක් පිළිබඳ හසිතගේ අදහස ව්‍යාපාර අධ්‍යයනය හදාරන ශිෂ්‍යයකු ලෙස ඔබ දකින ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) ගෝලීයකරණයත් සමග ව්‍යාපාර කටයුතු වර්තමානයේ නව මාවතකට පිවිසී ඇත.

(අ) ගෝලීයකරණය යන්නෙන් කුමක් අදහස් වේදැයි අර්ථකතනය කරන්න. (ලකුණු 02)

(ආ) ගෝලීයකරණය ව්‍යාප්තවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) ''ඇල්මැති පාර්ශව ව්‍යාපාර කෙරෙහි සැලකිලිමත්වනවා මෙන්ම ව්‍යාපාර ද ඇල්මැති පාර්ශව කෙරෙහි සැලකිලිමත් වේ.

මෙසේ ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශව හතරක් නම් කර එම පාර්ශව කෙරෙහි ව්‍යාපාර සැලකිලිමත් වීමට හේතු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) ''වර්තමානයේ පවතින්නේ විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර පදනම් වූ යුගයකි.''

(අ) විද්‍යුත් වානිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) විද්‍යුත් වාණිජ්‍යය මගින් ව්‍යාපාරවලට හා ගණුදෙනුකරුවන්ට ලැබිය හැකි ප්‍රතිලාභ දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 02)

(v) චතුරි විදේශ රැකියාවක නිරත ව සිට ලංකාවට පැමිණ ''චතුරි ඇඟළුම්'' නමින් ඇඟළුම් කර්මාන්ත ශාලාවක් ආරම්භ කරන ලදී. එම කර්මාන්ත ශාලාවේ ඇඟළුම් නිෂ්පාදිතයට අදාළ ව්‍යාපාර ක්‍රියාවලිය යෙදවුම් නිමැවුම් සටහනක් මගින් දක්වන්න. (ලකුණු 04)

02. (i) පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා විවිධ රාජ්‍ය ආයතන වර්තමානයේ දී බිහි වී ඇත.

(අ) ''පාරිභෝගික ආරක්ෂණය'' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ආ) පාරිභෝගික ආරක්ෂණය සඳහා ලංකාව තුළ කටයුතු කරන රාජ්‍ය ආයතන මොනවාද? (ලකුණු 02)

(ii) කමල් තම ප්‍රදේශයේ බහුලව ඇති රබර් යොදා ගෙන රබර් ආශ්‍රිත මෙට්ට නිෂ්පාදනය කිරීමේ කර්මාන්තශාලාවක් පවත්වාගෙන යනු ලැබේ. මෙම කර්මාන්තශාලාව පවත්වාගෙන යාමේ දී ඔහුට සමාජයේ විවිධ පාර්ශවයන්ට වගකීම් ඉටුකිරීමට සිදුවේ.

(අ) කමල් විසින් සමාජයට හා ගනුදෙනුකරුවන්ට ඉටුකළ යුතු සමාජ වගකීම් දෙක බැගින් වෙන වෙනම ලැයිස්තුගත කරන්න. (ලකුණු 02)

(ආ) සමාජයීය වගකීම් ඉටුකිරීමෙන් කමල්ගේ ව්‍යාපාරයට අත්වන ප්‍රතිලාභ 4ක් සඳහන් කරන්න.(ලකුණු 02)

(iii) නූතන සමාජයේ නිෂ්පාදන හා පරිභෝජන ක්‍රියාකාරකම් නිසා දිනකට දැරිය නොහැකි ප්‍රමාණයකින් අපද්‍රව්‍ය එකතුවීම ගෝලීය ප්‍රශ්නයක් බවට පත් වී ඇත. එබැවින් අපද්‍රව්‍ය කළමනාකරණයේදී 4R සංකල්පය භාවිතයෙන් තිරසර සංවර්ධනය සාක්ෂාත් කරගැනීමට උත්සාහ ගනී.

(අ) 4R සංකල්පයට අදාළ සංරචක නම් කර උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 02)

(ආ) තිරසර සංවර්ධනය ගොඩනැගී ඇති ප්‍රධාන කුළුණු තුන නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 02)

(iv) ප්‍රතිපත්ති සම්පාදනය කරමින් රජය ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරයි. මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන ප්‍රතිපත්ති සම්පාදනය කරමින් ව්‍යාපාර කෙරෙහි මැදිහත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) (අ) වර්තමාන ගෝලීය පරිසරය තුළ පෞද්ගලික ව්‍යවසායකයින් කොතරම් ක්‍රියාත්මක වුවද ''රජය ව්‍යාපාර කටයුතු සඳහා දායක වේ.'' හේතු දක්වන්න. (ලකුණු 02)

(ආ) පාරිභෝගිකයාට උසස් තත්ත්වයේ භාණ්ඩයක් ලබාදීම සහතික කරන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඉමහත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. එහි කාර්යයන් 4ක් ලියන්න. (ලකුණු 02)

03. (i) සාලිය නිතරම තනි තීරණ ගැනීමට කැමති පුද්ගලයකු වන අතර අන් අය සමඟ සිදු කරන කටයුතු පිළිබඳව ඔහුට විශ්වාසයක් නොමැති අතර තනිවම අවදානම් විඳදරා ගැනීමට ද කැමති පුද්ගලයෙකි.

සමන් සියලු දෙනාගේ අදහස්වලට සවන් යොමු කරන අතර අන් අයගේ කටයුතු පිළිබඳව දැඩි විශ්වාසයක් පවතින අතර සාමූහිකව අවදානම් බෙදාගෙන කටයුතු කිරීමේ හැකියාව ඇත්තෙකි.

(අ) සාලිය සහ සමන්ට ආරම්භ කිරීමට සුදුසු ව්‍යාපාර සංවිධාන මොනවාදැයි පිළිවෙළින් ලියන්න.

(ලකුණු 02)

(ආ) සාලිය සහ සමන් තම ව්‍යාපාර දෙක ආරම්භ කළේ නම් එම ව්‍යාපාර දෙක අතර දැකිය හැකි සමානතා 4ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ''සමුපකාර ව්‍යාපාරය පෞද්ගලික අංශයේ ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධාන වර්ගයකි.''

(අ) සමුපකාර ව්‍යාපාරවල දැකිය හැකි සීමා 4ක් නම් කරන්න. (ලකුණු 02)

(ආ) සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීමට ඔබට කළහැකි යෝජනා 4ක් ලියන්න. (ලකුණු 02)

(iii) පහත නිර්නායක පදනම් කර ගනිමින් සීමිත පෞද්ගලික සමාගමක් සීමිත පොදු සමාගමකින් වෙනස්වෙන ආකාරය පැහැදිලි කරන්න.

| නිර්නායක | සීමිත පෞද්ගලික සමාගම් | සීමිත පොදු සමාගම් |
|---|---|---|
| සාමාජික සංඛ්‍යාව | .................................................... | ........................................... |
| ප්‍රාග්ධන සම්පාදනය | .................................................... | ........................................... |
| පරිපාලනය හා කළමනාකරණය | .................................................... | ........................................... |
| ලාභාංශ බෙදීම | .................................................... | ........................................... |

(ලකුණු 04)

(iv) හවුල් ව්‍යාපාරයක කටයුතු පවත්වාගෙන යාමේ දී හවුල්කරුවන් අතර ඇතිකර ගනු ලබන හවුල් ඔප්පුව හැඳින්විය හැකිය.

(අ) හවුල් ව්‍යාපාරයකට හවුල් ඔප්පුව වැදගත් වීමට හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ආ) හවුල් ඔප්පුවක සාමාන්‍යයෙන් ඇතුළත් කරුණු 4ක් ලියන්න. (ලකුණු 02)

(v) සුනිල් තමා විසින් ආරම්භ කළ ව්‍යාපාරය මෙහෙයවයි. ඔහු නිතර නව ව්‍යාපාර අවස්ථා දකිමින් ඒවා ග්‍රහණය කර ගනිමින් මූල්‍ය අවදානම් සහිත කටයුතු අත්හදා බලමින් සිටියි. ව්‍යාපාරය පැවැත්මට අදාළ තීරණ ගනු ලබන සුනිල් ව්‍යාපාරයේ පාලන කටයුතු ද නම්‍යශීලීව සිදු කරයි. පවතින සම්පත් ද මනා ලෙස කළමනාකරණය කරන අතර සිය ව්‍යාපාරයේ සේවකයන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමට හැකි සියලු දෑ ඔහු සිදු කරයි.

(අ) සුනිල් තුළ පවතින ව්‍යවසායකත්වගති ලක්ෂණ 4ක් නම් කරන්න. (ලකුණු 02)

(ආ) සුනිල් ව්‍යවසායකයකු මෙන්ම දක්ෂ කළමනාකරුවෙකු ද වේ. කළමනාකරු හා ව්‍යවසායකයා අතර වෙනස්කම් 4ක් ලියන්න. (ලකුණු 02)

04. (i) ''රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විවිධ ආකාරයෙන් දායකත්වය ලබාදෙයි.'' මෙම ප්‍රකාශය හේතු සහිතව විමසන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නියෝජිතයකු ලෙස කටයුතු කරන ලබන කේන්ද්‍රීය ආයතනය වේ.

(අ) මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන් 4ක් නම් කරන්න. (ලකුණු 02)

(ආ) ව්‍යාපාරික කටයුතු සාර්ථක කර ගැනීමට මහබැංකු කටයුතු ඉවහල්වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iii) (අ) තැන්පතුභාර ගැනීම හා ණය සැපයීමට අමතරව වාණිජ බැංකු විසින් විවිධ සේවා සපයනු ලැබේ. එවැනි සේවා 4ක් නම් කරන්න. (ලකුණු 02)

(ආ) ''ආයෝජන කළමනාකරුවන්'' යන්න හඳුන්වා එම ආයතන සපයන සේවා 2ක් නම් කරන්න.

(ලකුණු 02)

(iv) විද්‍යුත් මුදල් භාවිතය වර්තමානයේ ව්‍යාපාරික ලෝකය තුළ ඉතාමත් ජනප්‍රිය වෙමින් පවතී.

(අ) ගනුදෙනු සඳහා විද්‍යුත් මුදල් භාවිතයේ දී ගෙවීම් පහසු කිරීම සඳහා යොදා ගනු ලබන පහසුකම් 4ක් නම් කරන්න.

(ආ) විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමේ දී වාසි මෙන්ම අවාසි ද පවතී. එසේ විය හැකි අවාසි 4ක් ලියන්න.

(ලකුණු 02)

(v) ජංගම ගිණුම පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයන්ට ලබාගත හැකි පහසුකමක් ලෙස චෙක්පත් මගින් ගෙවීම් කිරීම දැක්විය හැකිය.

(අ) ''ධාරක චෙක්පතක් ''හා ''විධාන චෙක්පතක්'' අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) චෙක්පතකට පිටසනක් යෙදීමට අවශ්‍ය වන අවස්ථා දෙක් ලියන්න. (ලකුණු 02)

## ''ආ'' කොටස

05. (i) රටක මූල්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද මුදලක තිබිය යුතු ලක්ෂණ ලියන්න. (ලකුණු 04)

(ii) (අ) චෙක්පතට සම්බන්ධ පාර්ශව සඳහන් කරන්න. (ලකුණු 02)

(ආ) ව්‍යාපාරිකයන්ට ඍජුවම මුදල් ගෙවනවාට වඩා චෙක්පත්වලින් ගෙවීම වාසිදායක වන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(ඇ) බැංකු කරුවෙක් චෙක්පතකට ගෙවීම නොකරන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(ඉ) චෙක්පත් රේඛන වර්ග දෙකකි. එක් එක් ඒවාට උදාහරණය බැගින් ඇඳ දක්වන්න. (ලකුණු 02)

(iii) හරපතක මුහුණත හා පසුපිටේ සඳහන්වන ලක්ෂණ වෙන වෙනම ලියන්න. (ලකුණු 04)

(iv) (අ) ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන වර්ගකිරීම යටතේ විශේෂිත මූල්‍ය ආයතන හා ගිවිසුම් ගත ඉතිරි කිරීමේ ආයතන දෙක බැගින් නම් කරන්න. (ලකුණු 02)

(ආ) සමුපකාර ග්‍රාමීය බැංකුවල කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

(v) ස්වයංක්‍රීය බැංකු සේවා යන්න හඳුන්වා එමගින් ගනුදෙනුකරු හා බැංකුවලට අත්වන වාසි හා අවාසි වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 04)

06. (i) ජීවිත රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය පැහැදිලි කර එම රක්ෂණ දෙක අතර වෙනස්කම් ලියන්න. (ලකුණු 04)

(ii) ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණය දායක වන්නේ කෙසේදැයි දක්වන්න. (ලකුණු 04)

(iii) ගිනි රක්ෂණය හඳුන්වා ඒ යටතේ ආවරණය කළ හැකි අවදානම් ලියන්න. (ලකුණු 04)

(iv) (අ) රක්ෂණයේ පදනම අවදානමයි. රක්ෂණය කළ හැකි අවදානමක් ලෙස පිළිගැනීමට තිබිය යුතු ගුණාංග මොනවාද?(ලකුණු 02)

(ආ) මෝටර් රථ රක්ෂණයේ දී විස්තීරණ රක්ෂණ ඔප්පුව හා අවම තෙවන පක්ෂ රක්ෂණ ඔප්පුව හඳුන්වන්න. (ලකුණු 02)

07. (i) (අ) හොඳ සන්නිවේදනයක් ව්‍යාපාරයකට වැදගත් වන්නේ ඇයිද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග නම් කරන්න. (ලකුණු 02)

(ii) (අ) ලිඛිතව සන්නිවේදනය කිරීමේ වාසි 2ක් හා අවාසි 2ක් ලියන්න. (ලකුණු 02)

(ආ) විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය හතරක් ලියන්න. (ලකුණු 02)

(iii) (අ) ප්‍රවාහන පද්ධතියක මූලිකාංග නම් කරන්න. (ලකුණු 02)

(ආ) දුම්රිය මාර්ග ප්‍රවාහනයේ වාසි හා අවාසි ලියන්න. (ලකුණු 02)

(iv) (අ) මහා මාර්ග ප්‍රවාහනය කෙරෙහි බලපාන නෛතික කරුණු හතරක් ලියන්න. (ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකාව තුළ බස්රථ ධාවකයින් මුහුණ පාන ගැටළු හතරක් ලියන්න. (ලකුණු 02)

(v) (අ) සුදුසු ප්‍රවාහන පද්ධතියක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු සාධක නම් කරන්න. (ලකුණු 02)

(ආ) ප්‍රවාහන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා කිහිපයක් ලියන්න. (ලකුණු 02)

08. (i) (අ) වෙළඳාමේ ප්‍රභේද ගැලීම් සටහනකින් දක්වන්න. (ලකුණු 02)

(ආ) සිල්ලර වෙළෙන්දාගෙන් පාරිභෝගිකයාටත්, නිෂ්පාදකයාටත් අත්වන ප්‍රයෝජන 2 බැගින් ලියන්න. (ලකුණු 02)

(ii) සිල්ලර වෙළඳාමේ නව ප්‍රවණතා සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) (අ) ශ්‍රී ලංකාවේ කාර්මික අපනයන හතරක් ලියන්න. (ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකාවේ ආනයනික පාරිභෝගික භාණ්ඩ හතරක් ලියන්න. (ලකුණු 02)

(iv) රටක් විදේශ වෙලඳාමේ යෙදීමෙන් අත්කරගත හැකි වාසි / ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04)

(v) විද්‍යුත් වෙළඳාමෙන් ව්‍යාපාරිකයාට හා පාරිභෝගිකයාට අත්විය හැකි වාසි දෙක බැගින් ලියන්න. (ලකුණු 04)

Answer

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

General Certificate of Education (Adv.Level), Grade 12, Year End Test, July 2019

## ව්‍යාපාර අධ්‍යයනය - Business Studies
## පිළිතුරු පත්‍රය

I පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. - 5 | 06. - 3 | 11. - 2 | 16. - 3 | 21. - 3 | 26. - 5 |
| 02. - 3 | 07. - 2 | 12. - 4 | 17. - 4 | 22. - 2 | 27. - 4 |
| 03. - 3 | 08. - 4 | 13. - 3 | 18. - 2 | 23. - 1 | 28. - 2 |
| 04. - 4 | 09. - 5 | 14. - 2 | 19. - 2 | 24. - 2 | 29. - 2 |
| 05. - 3 | 10. - 2 | 15. - 2 | 20. - 4 | 25. - 3 | 30. - 5 |

(ලකුණු 2 × 30)

31. (අ) විශේෂීකරණය, අතිරික්ත නිෂ්පාදන
(ආ) පාරිභෝගිකයන්, තරගකරුවන්

32. (අ) සමාජයීය වගකීම, ව්‍යාපාර ආචාර ධර්ම
(ආ) සාධාරණ ලාභයක්, සාධාරණ මිලක්

33. (අ) මධ්‍යම පරිසර අධිකාරිය
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
(ආ) ආර්ථික තිරසාර සංවර්ධනය
පාරිසරික තිරසාර ආරක්ෂණය
සමාජ තිරසර සංවර්ධනය

34. (අ) තිරස් සංයෝජන, සිරස් සංයෝජන
(ආ) විදේශීය සමාගමක්, අක් වෙරළ සමාගම්

35. (අ) කළමනාකරු, නායකයා
(ආ) ප්‍රමාණාත්මක, ගුණාත්මක

36. (අ) තත්කාලීන දළ පියවුම් පද්ධතිය
නිර්ලේඛන සුරකුම් තැන්පතු පද්ධතිය
(ආ) ණයකරු, ආදායකයා, බැංකුකරු

37. (අ) හානිපූරණය, දායකත්වය, ආදේශනය
(ආ) ඉන්ට්‍රානෙට්, ඉන්ටර්කොම්

38. (අ) මාලඹේ - කොළඹ කොටුව
(ආ) දක්ෂිණ අධිවේගී මාර්ගය
පිටත වටරවුම් අධිවේගී මාර්ගය
කොළඹ කටුනායක අධිවේගී මාර්ගය

39. (අ) ආනයන, අපනයන, ප්‍රතිඅපනයනය, අන්තරාල
(ආ) සිල්ලර වෙළෙන්දා, තොග වෙළෙන්දා
නියෝජිතයා

40. (1) අසත්‍ය (2)සත්‍ය (3)අසත්‍ය (4) සත්‍ය

41. 1. නිෂ්පාදනය/මෙහෙයුම්
2. අලෙවිකරණය 3. මූල්‍ය කටයුතු
4. පරිපාලනය
5. මානව සම්පත් කළමනාකරණය

42. 1. පාරිභෝගිකයන් 2. සැපයුම්කරුවන්
3. තරගකරුවෝ
4. ආදේශන භාණ්ඩ නිෂ්පාදකයෝ
5. වෙළඳපලට පිවිසීමට අපේක්ෂා කරන නව ව්‍යාපාරිකයෝ

43. 1. ආර්ථික වර්ධනය හා ස්ථායිතාවය
2. කාර්යක්ෂමතාවය
3. තරගකාරිත්වය
4. සේවා නියුක්තිය
5. අන්තර්ජාතික වෙළඳාම

44. 1. බදු ගෙවීම 2. දේශීය සම්පත් භාවිතය
3. නීතිරීති පිළිපැදම
4. සේවා නියුක්තියට දායකවීම
5. රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම
6. පරිසර හානිය අවම කිරීම

45. 1. ලාභ ලැබීමේ අරමුණක් තිබීම
2. ව්‍යාපාර කටයුත්තක් පැවතීම
3. පුද්ගලයන් සිටීම
4. අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් තිබීම.

46. 1. දේශීය සම්පත් උපයෝජනය
2. ප්‍රාදේශීය සංවර්ධනය සිදුවීම
3. නව භාණ්ඩ හා සේවා වෙළඳපොළට පැමිණීම
4. රැකියා අවස්ථා ජනනය වීම
5. නිමැවුම් අපනයනය තුළින් විදේශ විනිමය ඉපයීමට හැකිවීම.
6. රටේ සමස්ත නිෂ්පාදනය ඉහළ යාම

47. 1. ණයපත් හිමියා
2. විකුණුම්කරු
3. ණයපත් නිකුතු ආයතනය
4. ණයපත් සංගමය

48. 1. වයස
2. ඔප්පුවේ වටිනාකම
3. රක්ෂිතයාගේ සෞඛ්‍ය තත්ත්වය
4. රක්ෂිතයාගේ ආදායම
5. කල් පිරීමට ගතවන කාලය

49. 1. ආනයනය සීමා කිරීම/පංගුකිරීම
2. අපනයනය සීමා කිරීම
3. ආනයන අපනයන තහනම් කිරීම
4. වෙළඳ ගිවිසුම
5. දැඩි විනිමය ප්‍රතිපත්ති

50. 1. Eco Recycle
2. අවවාදයයි/අනතුරකි
3. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
4. ජාතික ජල සම්පාදන මණ්ඩලය

## II පත්‍රය

01. (i) මානව අවශ්‍යතා හා වුවමනා ඉටුකරලීමට සිදුකරන ඕනෑම ආර්ථික කටයුත්තක් ව්‍යාපාරයක් ලෙස හඳුන්වයි.

ලාභ ලැබීමේ පරමාර්ථයෙන් හෝ නොලැබීමේ පරමාර්ථයෙන් පවත්වාගෙන යන ආර්ථික කටයුතු වේ.

සුභ සාධන අරමුණෙන් ද ව්‍යාපාර පවතී. චතුර ඉදිරිපත් කර ඇති ප්‍රකාශයට පක්ෂව හා විපක්ෂව කරුණු ඉදිරිපත් කළ හැක. (ලකුණු 04)

(ii) (අ) ආර්ථික, දේශපාලනමය සමාජ හා සංස්කෘතිමය වශයෙන් රටවල් අතර ඇති සම්බන්ධතාවයයි. (ලකුණු 02)

(ආ) * තොරතුරු තාක්ෂණය දියුණුවීම
* සන්නිවේදනය දියුණු වීම (ලකුණු 02)

(iii) 1. **අයිතිකරුවන්** ආයෝජන වැඩිකර ගැනීමට ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කිරීමට
2. **සේවකයන්** - සේවක කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සේවකයන් රඳවා ගැනීමට
3. **ණය හිමියන්** - අඛණ්ඩව අවශ්‍ය අරමුදල් සම්පාදනය අඩු පිරිවැයකින් අරමුදල් සම්පාදනය
4. **රජය** - බදු සහන ලබා ගැනීමට යටිතල පහසුකම් ලබාගැනීමට (ල. 04)

(iv) (අ) විද්‍යුත් වානිජ්‍යය -අන්තර්ජාලය හරහා මිලදී ගැනීමේ හා විකිනීමේ කටයුතු කිරීම

විද්‍යුත් ව්‍යාපාර - ව්‍යාපාරවලට අදාළ සියලුම කාර්යයන් අන්තර්ජාලය හරහා සිදු කිරීම. (ලකුණු 02)

(ආ) <u>ව්‍යාපාරවලට</u>

*ව්‍යාපාර කටයුතු වේගවත් වීම
*පිරිවැය අඩුවීම
*ගෝලීය වූ වෙළඳපොළ අවකාශයක් බිහිවීම
*ගනුදෙනු ප්‍රමාණය වැඩිවීම (ල. 01)

<u>ගණුදෙනුකරුවන්ට</u>

*භාණ්ඩවල පිරිවැය අඩුවීම
* කාලය හා ශ්‍රමය ඉතුරුවීම
*තෝරාගැනීමට වැඩි ඉඩකඩක් තිබීම
* ඕනෑම විටක සේවය ලබාගත හැකිවීම

(ලකුණු 01)

(v)

| යෙදවුම් | ක්‍රියාවලිය | නිමැවුම් |
|---|---|---|
| **භූමිය**<br>*ඇඟළුම්හල පිහිටි භූමිය<br>**ප්‍රාග්ධනය**<br>*ගොඩනැගිලි<br>* මහන මැෂින්<br>**ව්‍යවසායකත්වය**<br>* ඇඟළුම්හල් අයිතිකරු<br>**තොරතුරු**<br>*ඇඟළුම් මෝස්තර නිර්මාණ<br>* නව වෙළඳපලවල්<br>**කාලය**<br>* වැඩ කරන සේවා මුර ගණන<br>* අතිකාල පැය ගණන<br>**දැනුම**<br>* සේවක කුසලතා<br>*කළමනාකරුවන් සතු දැනුම | → **නිෂ්පාදනය**<br>*රෙදි තොග ලබා ගැනීම<br>*ගුණත්වය පරීක්ෂා කිරීම<br>**අලෙවිකරණය**<br>*ප්‍රචාරණය<br>* බෙදාහැරීම<br>**පරිපාලනය**<br>* සේවක ලිපි ගොනු සැකසීම<br>* සේවක පැමිණීමේ ලේඛන<br>**මූල්‍ය කටයුතු**<br>*අරමුදල් සම්පාදනය<br>*නිසිපරිදි මුදල් යෙදවීම<br>**මානව සම්පත් කටයුතු**<br>* සේවක පුහුණු කිරීම<br>*සේවක උසස්වීම්<br>**පර්යේෂණ හා සංවර්ධනය කටයුතු**<br>*නිෂ්පාදනවල ගුණත්වය වර්ධනය<br>*සමීක්ෂණ පැවැත්වීම | → **ඇඟළුම්** |

(ලකුණු 04)

02. (i) (අ) පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබාදීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය පාරිභෝගික ආරක්ෂණය නම් වේ.

(ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

මධ්‍යම පරිසර අධිකාරිය

ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය

මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ii) (අ) **සමාජයට :** පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම

ප්‍රජා සත්කාර සේවා රැකියා නියුක්තියට දායක වීම

බදු ගෙවීම.

**ගනුදෙනුකරුවන්ට :** සාධාරණ වීම

හානි අවම කිරීම

අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

(ආ) * ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම
* ව්‍යාපාරයේ ප්‍රතිරූපය වර්ධනය වීම
* ව්‍යාපාරය පිළිබඳ විශ්වසනීයත්වය වර්ධනය වීම.
* ගනුදෙනුකරුවන් තෘප්තිමත් කළ හැකි වීම
* ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ කරා ළඟාවීම පහසුවීම. (ලකුණු 02)

(iii) (අ) ප්‍රතිචක්‍රීකරණය කිරීම

නැවත නැවත භාවිතා කිරීම

භාවිතය අඩු කිරීම

නැවත ස්ථාපිත කිරීම (ලකුණු 02)

(උදා:- පැහැදිලි කරන්න.)

(ආ) ආර්ථික තිරසාර සංවර්ධනය

පරිසර තිරසර ආරක්ෂණය

සමාජ තිරසර සංවර්ධනය (ලකුණු 02)

(පැහැදිලි කරන්න.)

(iv) මධ්‍යම රජය- මූල්‍ය ප්‍රතිපත්ති හා පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

පළාත් සභා - ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම

පළාත් පාලන ආයතන - පරිසර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම (ල. 04)

(v) (අ) * ඒකාධිකාරි ආයතන බිහිවීම වැලැක්වීම
* සම්පත් නාස්තිය අවම කිරීමට
* පොදු ජනයාට අත්‍යවශ්‍ය සේවා සැලසීම
* ජාතික ආරක්ෂාව සඳහා
* ලාභ ප්‍රතිආයෝජනය තුළින් ආර්ථික සංවර්ධනය සැලසීම (ලකුණු 02)

(ආ) * ප්‍රමිති පිළියෙළ කිරීම
* ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
* ISO ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
* උපකරණ ක්‍රමාංකන සේවා
* පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම
* පුස්තකාල සේවාව

* ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන ප්‍රවර්ධන කටයුතු
* ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය

(ලකුණු 02)

03. (i) (අ) සාලිය - කේවල ස්වාමි ව්‍යාපාර
සමන් - හවුල් ව්‍යාපාර (ලකුණු 02)

(ආ) * වගකීම් අසීමිත වීම
* නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම
* ලියාපදිංචිය අනිවාර්ය නොවීම
* අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම

(ii) (අ) * රාජ්‍ය අංශයේ මැදිහත්වීම සිදුවීම
* සීමිත කාලයක් පමණක් විවෘතව තැබීම
* සමුපකාර ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කිරීම
* ණයට භාණ්ඩ විකිණීමක් සිදු නොවීම.

(ලකුණු 02)

(ආ) * සමුපකාරය විවෘතව තබන වේලාව දියුණු කිරීම
* විවිධ ප්‍රවර්ධන උපක්‍රම භාවිතය
* සාමාජික ප්‍රතිලාභ වැඩිවීම
* පාරිභෝගික සේවා සැපයීමට නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම.
* පාරිභෝගික ආකර්ෂණය සඳහා වෙළඳසැල් දර්ශනීයව සකස් කිරීම

(iii)

| නිර්නායක | සීමිත පෞද්ගලික සමාගම් | සීමිත පොදු සමාගම් |
|---|---|---|
| සාමාජික සංඛ්‍යාව | අවමය 1 උපරිමය 50 | අවමය 01 උපරිමය සීමාවක් නැත |
| ප්‍රාග්ධන සම්පාදනය | ප්‍රසිද්ධියේ මහජනතාවට කොටස් හෝ සුරැකුම්පත් නිකුත් කළ නොහැක. | ප්‍රසිද්ධියේ මහජනතාවට කොටස් හෝ සුරැකුම්පත් නිකුත් කළ හැකිය. |
| පරිපාලනය හා කළමනාකරණය | අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදුවේ. අවම අධ්‍යක්ෂවරු 1කි. | අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදුවේ. අවම අධ්‍යක්ෂවරු 2කි. |
| ලාභාංශ බෙදීම | ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයකින් තොරව කොටස්කරුවන්ගේ කැමැත්ත මත ලාභාංශ බෙදයි. | ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළ යුතුය. |

(ලකුණු 04)

(iv) (අ) *හවුල්කරුවන් අතර මතභේද හා ආරවුල් බොහෝදුරට විසඳාගත හැකිවීම.
* හවුල් ව්‍යාපාරයේ කටයුතු පවත්වාගෙන යාමේ දී පහසුවක් වීම (ලකුණු 02)

(ආ)* ව්‍යාපාරය පිළිබඳ මූලික තොරතුරු
* ප්‍රාග්ධනය යෙදීම පිළිබඳ විස්තර
* හවුල් ව්‍යාපාරයේ පරමාර්ථ
* ලාභ අලාභ බෙදාගන්නා ආකාරය
* ප්‍රාග්ධන පොලී හා ගැනිලි පිළිබඳ
* හවුල් ව්‍යාපාරය අවසන් කිරීම පිළිබඳව

(ලකුණු 02)

(v) (අ) * නව ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීම හැකියාව
* කැපවීම
* නම්‍යශීලී බව
* තීරණවලට පැමිණීමේ හැකියාව
* අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාව (ලකුණු 02)

| ව්‍යවසායකයා | ව්‍යාපාරිකයා |
|---|---|
| * අවදානමට මුහුණදේ<br>* නවෝත්පාදකයෙකි<br>* ව්‍යවසායකයාගේ ව්‍යාපාරික ප්‍රතිවාදියා වන්නේ තමාය.<br>* ගැටලු ඇති වූ විට ඒවා පිටුදැකීමට ධෛර්යමත්ව කටයුතු කරයි. | * ආරක්ෂාකාරීව කටයුතු කරයි<br>* සාම්ප්‍රදායිකයෙකි<br>* තවත් ව්‍යාපාරික ප්‍රතිවාදීන් ඇත.<br>* ගැටලු ඇති වූ විට අධෛර්යයට පත්වේ. |

(ලකුණු 02)

04. (i) *ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට දායකවීම
*ආදායමේ ව්‍යාප්තියේ විෂමතා අවම වීම
* මෙම ව්‍යාපාර ශ්‍රම සූක්ෂ්ම කර්මාන්ත නිසා වැඩිරැකියා ප්‍රමාණයක් සැපයිය හැකිවීම
*මහා පරිමාණ ව්‍යාපාර ඉටු නොකරන ව්‍යාපාර කටයුතුවල නිරත වීම (ලකුණු 04)

(ii) (අ) රාජ්‍ය ණය කළමණාකරණය
විදේශ විනිමය පාලනය
සේවක අර්ථසාධක අරමුදල
කළමනාකරණය (ලකුණු 02)

(ආ)* ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය
* සී/ස ලංකා ක්ලියර් (පෞද්) සමාගම
* නිශ්කාෂණ සේවා ඉටු කිරීම
* ලංකා ක්ලියර් පුද්ගලික සමාගම
* ලංකාපේ සන්නම් නාමය යටතේ පොදු කාඩ්පතක් හඳුන්වාදීම.
* ස්විෆ්ට් සන්නිවේදන ජාලය
* තත්කාලීන දළ පියවීම් පද්ධතිය
* ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධතිය

(ල. 02)

(iii) (අ) * නියෝජිත සේවා * ණයපත් සේවාව
* කල්බදු සේවා * මුදල් ප්‍රේෂණ කටයුතු
* විද්‍යුත් බැංකු සේවා
* උකස් සේවා
* සුරක්ෂිතාගාර පහසුකම් (ලකුණු 02)

(ආ) මහජනයාට කරනු ලබන සුරැකුම් නිකුතුවක දී ඒ සඳහා විවිධ සේවා සපයන ආයතනයන්ය.
* නිකුතුව පිළිබඳ ආයෝජන ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම.
* ආයෝජන ඉල්ලුම් පත්‍ර භාර ගැනීම
* ආයෝජකයින්ට සුරැකුම් බෙදා දීම.
* නිකුතුව පිළිබඳ මුදල් කළමනාකරණය
* ප්‍රචාරක කටයුතු (ලකුණු 02)

(iv) (අ) * ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර

* වෙළඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල
* ටෙලි බැංකු පහසුකම්
* අන්තර්ජාල බැංකු කටයුතු (ලකුණු 02)

(ආ)* වංචනික ක්‍රියා සිදුවීම
* අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම
* පොළී ප්‍රමාද ගාස්තු වැනි පිරිවැය දැරීමට සිදුවීම
* තාක්ෂණික දෝෂ නිසා ගනුදෙනුවලට බාධා ඇතිවීම. (ලකුණු 02)

(v) (අ) ධාරක චෙක්පත - චෙක්පතෙහි මුද්‍රිතව ඇති හෝ රැගෙන එන්නාට'' යන පදය කපා නොහැර ඇති චෙක්පතකි. පිටසන් කිරීමෙන් තොරව හෝ භාර දීමෙන් ධාරක චෙක්පත පැවරිය හැකි අතර මුදල් නෝට්ටුවකට සමාන වේ. (ලකුණු 01)

විධාන චෙක්පත - හෝ රැගෙන එන්නාට යන පදය කපා හැර ඒ වෙනුවට විධානයට'' යන පදය ලියා ඇති චෙක්පතයි. (ලකුණු 01)

(ආ) *ආදායකයා විසින් චෙක්පත බැංකුවෙහි තැන්පත් කිරීමේ දී
*විධාන චෙක්පතක් නම් අන් අයෙකුට පවරන අවස්ථාවේ දී
* රේඛනය නොකරන ලද චෙක්පත් බැංකු කවුන්ටරයට දී මුදල් ලබා ගැනීමේ දී
(ලකුණු 02)

''ආ'' කොටස

05. (අ) I (i) පොදු පිළිගැනීම
(ii) කල්තබා ගත හැකි වීම
(iii) කුඩා ඒකක වලට බෙදීමේ හැකියාව
(iv) ගෙන යාමේ පහසුව
(v) පහසුවෙන් හඳුනාගත හැකිවීම
(vi) සුලභ හෝ දුලභ නොවීම
(vii) නාමික අගය ද්‍රව්‍යමය අගයට වඩා වැඩිවීම
(viii)අනුකරණය දුෂ්කරවීම
(1/2 × 8 = ලකුණු 04)

II. 1. අණකරු, අණලද්දා, ආදායකයා
(ලකුණු 01)

2. ගෙවීම කළ බව පහසුවෙන් ඔප්පුකළ හැකි වීම.
චෙක්පත්වලින් ගෙවීම වඩාත් ආරක්ෂාකාරී වීම.
විශාල වටිනාකම් වලින් යුක්ත මුදල් චෙක්පත්වලින් ගෙවීම වඩා යෝග්‍ය වීම.
ගෙවීම ප්‍රමාද කිරීමට හෝ අත්හිටුවීමට හැකිවීම. (1/2 × 2 = ලකුණු 01)

3. ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොමැතිවීම
අණකරුගේ අත්සන වැරදි වීම.
චෙක්පත වැරදියට ලියා තිබීම
චෙක්පත යල් පැනගොස් තිබීම
(1/2 × 2 = ලකුණු 01)

4. සාමාන්‍ය රේඛනයට හා විශේෂ රේඛනයට නිවැරදි උදාහරණ දක්වා ඇත්නම් (1/2 × 2 = ලකුණු 01)

III. හරපතක මුහුණත,
1. හරපත් සන්නම් ලාංඡනය Brand Logo
2. හරපත් අංකය
3. කල් ඉකුත්වන දිනය
4. හරපත් හිමියාගේ නම
5. නිකුත් කරන ලද බැංකුවේ ලාංඡනය
(ලකුණු 02)

පිටුපස ලක්ෂණ
1. ආරක්ෂිත ලාංඡනය
2. හරපතේ ආරක්ෂිත සංකේතය
3. නිකුතු ආයතනයේ කොන්දේසි
4. අත්සන් පටිය
5. කාන්දම් පටිය
6. ගනුදෙනුකර ක්ෂණික සේවා ඇමතුම් අංකය (ලකුණු 02)

(iv) (අ)විශේෂිත මූල්‍ය ආයතන
විශේෂිත කල්බදුකරණ මූල්‍ය සමාගම්
කොටස් තැරැව්කරුවන්
ප්‍රාථමික අලෙවි කරුවන්
ඒකකභාර
ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
(1/2 × 2 = ල. 01)

ගිවිසුම්ගත ඉතුරුම් ආයතන
රක්ෂණ සමාගම්
සේවක අර්ථ සාධක අරමුදල
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල
අනුමත විශ්‍රාම හා අර්ථ සාධක අරමුදල්
රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල්
(1/2 × 2 = ල. 01)

(v) ස්වයංක්‍රීය බැංකු සේවා යනු බැංකු ගිණුම් හිමියන්ට තම බැංකුවෙන් ලබා දී ඇති පහසුකම් බොහොමයක් බැංකුවට නොගොස් දවසේ ඕනෑම වේලාවක ලබාගැනීමට හැකි වන සේ හඳුන්වා දී ඇති විද්‍යුත් අරමුදල් හුවමාරු ක්‍රමයකි.
(ලකුණු 01)

**බැංකුවට අත්වන වාසි**
1. නිරවද්‍යතාව ඉහළයාම
2. පිරිවැය අධිකවීම
3. තදබදය අඩුවීම
4. බැංකු සේවා පුළුල් වී බැංකුවල ලාභදායිත්වය වැඩිවීම (1/2 × 3 = ල. 1 1/2)

**ගණුදෙනුකරුට අත්වන වාසි**
1. ටෙලර් කාඩ්පත් භාවිතයෙන් මුදල් ආපසු ගැනීම
2. ගිණුමකින් ගිණුමකට මුදල් මාරුකිරීම
3. ගිණුමට මුදල් තැන්පත් කිරීම
4. ගිණුමේ ශේෂය දැනගත හැකිවීම
5. බිල්පත් ගෙවීම පහසුවීම
(1/2 × 3 = ල. 1 1/2)

06. I ජීවිත රක්ෂණය යනු රක්ෂිතයාගේ මරණය හා වෙනත් ශාරීරික උපද්‍රව හේතුවෙන් අවදානම්වලට මුහුණපෑවිට රක්ෂිතයාට හෝ ඔහුගේ යැපෙන්නන්ට මූල්‍යමය ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය ජීවිත රක්ෂණයයි. ජීවිත රක්ෂණයේ අරමුණ වන්නේ මරණය අකර්මන්‍යතාව හෝ මහළු වියට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් පුද්ගලයෙකුට සිදුවිය හැකි හානි වෙනුවෙන් ආරක්ෂාව සලසා දීමයි.

වෙනස්කම්
1.ජීවිත රක්ෂණයේ අවදානම් නිශ්චිත වේ. අනෙකුත් රක්ෂණයේ ද අවදානම නිශ්චිත නොවේ.

2.ජීවිත සඳහා හානි පූර්ණය ආදේශනය හා දායකත්ව මූලධර්ම බල නොපාන අතර සාමාන්‍ය රක්ෂණයේ ද එම මූලධර්ම බලපායි.

3.ජීවිත රක්ෂණ ඔප්පුව පැවරිය නොහැක. අනෙකුත් රක්ෂණ ඔප්පු පැවරිය හැකිය.

(මේ සඳහා ඇති තවත් වෙනස්කම්වලට ලකුණු දෙන්න. රක්ෂණ වර්ග පැහැදිලි කිරීමට ල. 02

වෙනස්කම්වලට (1 × 2 = ලකුණු 02

(ii) 1. රක්ෂණය මගින් ව්‍යාපාර අවදානම ආවරණය කිරීම නිසා ව්‍යාපාර ආරම්භයට ආයෝජකයන් පෙළඹෙයි.

2. මුහුදු උවදුරු රක්ෂණය නිසා ජාත්‍යන්තර වෙළඳාම දියුණු වී ඇත.

3.රක්ෂණ සමාගම් තමන් සතු ප්‍රාග්ධනය නැවත ආයෝජනයෙන් ව්‍යාපාර සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සැපයීම.

4.නිශ්පාදිත වගකීම් රක්ෂණය මගින් පාරිභෝගිකයන්ට සිදුවන හානි ආවරණය කිරීම.

5.සේවක වගකීම් රක්ෂණය මගින් සේවකයන්ට වන හානි ආවරණය කරගත හැකි වීම.

(කරුණු 4 ට ල. 04)

(iii) ගිනි රක්ෂණය යනු කිසියම් පුද්ගලයෙකුට අයත් ගොඩනැගිලි හෝ වෙනත් වත්කම් වලට ගින්නෙන් විය හැකි හානි ආවරණය කර ගැනීම සඳහා ලබා ගත හැකි රක්ෂණය වේ. ගිනි රක්ෂණය යටතේ පහත අවදානම් ආවරණය කර ගත හැකිය. කැරලි කෝලාහල, වැඩ වර්ජන හානි පිපිරවීමේ හානි, ජල ගැලීම්, සුළි සුළං, කුණාටු, විදුලිමය ආපදා, භූමි කම්පා, සුනාමි, ගුවන් යානා අනතුරු, ගැටීම් හානි, අනුශංගික අලාභ

ගිනි රක්ෂණය හැඳින්වීම ල. 02

ආවරණ වන හානි 4 කට ල. 02

(iv) අ. 1. පුරෝකතනය කළ හැකි වීම

2. අහඹුවකින් සිදුවූවක් වීම

3. සම්බන්ධතාවකින් තොරවීම

4. පත්‍යාපතය කළ හැකිවීම

(1/2 × 4 = ලකුණු 02)

ආ. අවදානමක් සඳහා රක්ෂණ ඔප්පු දෙකක් හෝ වැඩි ගණනක් ලබාගෙන ඇතිවිට දායකත්වය මූලධර්මය රක්ෂණ සමාගම් අතර බල පැවැත්වේ. එකම අවදානමක් සඳහා ගෙවන වන්දිය රක්ෂණ සමාගම් අතර බෙදා ගැනීම දායකත්වයෙන් සිදුවේ. ඔප්පුවල අනුපාතයට රක්ෂා වන්දි මුදල් බෙදා ගැනීම දායකත්වයේදී සිදුවේ. (ලකුණු 01)

රක්ෂිත දේපලකට හානියක් වූ විටදී රක්ෂණ සමාගම විසින් මුළු ආලාභයම රක්ෂිතයාට ගෙවනු ලබයි. රක්ෂිතයාට වෙනත් පාර්ශවයන්ගෙන් අලාභ ලබා ගැනීමට ඇති අයිතිය රක්ෂණ සමාගමට පවරා දේ.

(ලකුණු 01)

(v) (අ) ප්‍රති රක්ෂණය

රක්ෂණ සමාගමක් තමන් වෙත රක්ෂණය කර ඇති රක්ෂිතයන්ගේ රක්ෂණ ඔප්පු රක්ෂිතයන්ගේ අනුදැනුම ඇතිව වෙනත් රක්ෂණ සමාගමක රක්ෂණයට යටත් කිරීම මින් අදහස් කරයි. මේ සඳහා වාරික ගෙවනු ලබන්නේ රක්ෂණ සමාගම විසිනි. මෙය රක්ෂකයෙකු හට වැදගත් වන්නේ තමා වෙත පවරා ඇති අවදානම අඩු කර ගත හැකි වීම නිසාය.

(ලකුණු 01)

ප්‍රාරක්ෂණය

විශාල වටිනාකමක් ඇති අවදානමක් කොටස් වශයෙන් වෙන්කර රක්ෂණ සමාගම් කිහිපයකට බාර දීම මෙහිදී සිදුවේ. මෙය විශේෂයෙන්ම අවදානම විභේදනය කළ හැකි නාවික ප්‍රවාහනයේ දී යොදා ගැනේ. තමන් භාර ගත් භාණ්ඩ තොගයට ඒ ඒ රක්ෂණ සමාගම වගකියනු ලැබේ. (ලකුණු 01)

(ආ) විස්තීරණ රක්ෂණ ඔප්පුව

මෙම ඔප්පුව මගින් අදාළ වාහනයට, වාහනයේ ගමන් ගන්නා මගීන්ට හා ගෙන යන භාණ්ඩ වලට ද බාහිර පුද්ගලයන්ට ද දේපල වලටත් යන පාර්ශව තුනටම සිදුවන හානි ආවරණය වේ. (ලකුණු 01)

අවම තෙවන රක්ෂණ ඔප්පුව

තෙවන පක්ෂ අවදානම් පමණක් මෙමගින් ආවරණය කරයි. එනම් බාහිර පාර්ශවවලට සිදුවන මරණ තුවාල හා දේපල හානි වලට වන්දි ගෙවනු ලැබේ. සෑම රථවාහන හිමියෙකුම ලබාගත යුතු රක්ෂණ සහතිකයයි. (ලකුණු 01)

06. I. අ. 1. සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වා ගැනීමට

2. වෙළඳ ගනුදෙනුවකදී අදාල පාර්ශව අතර අදහස් හුවමාරු කර ගැනීමට.

3. මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය කිරීමට

4. අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා

(1 × 2 = 02)

ආ. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග

යවන්නා පණිවුඩය

මාධ්‍ය ලබන්නා

ප්‍රතිපෝෂණය ප්‍රතිචාරය

කරුණු 6ට ලකුණු 02

II. අ. **ලිඛිතව සන්නිවේදනය කිරීමේ වාසි**

1. පණිවුඩය දුන් බවට සාක්ෂි තිබීම

2. නැවත නැවත භාවිතා කළ හැකිවීම

3. පණිවුඩය කෙටිකර ඉදිරිපත් කළ හැකිවීම

**අවාසි**

1. පිරිවැය අධිකවීම

2. ලිවීම කියවීම නොදන්නා අයට භාවිතා කළ නොහැකි වීම

3. භාෂා සම්බන්ධ අපහසුතා ඇතිවීම

වාසි 02 ට ලකුණු 01

අවාසි 02ට ලකුණු 01

(ආ) ඉන්ටර්කොම්, හඬතැපැල ගුවන් විදුලිය, විද්‍යුත් දැන්වීම් පුවරු, ඊ මේල්, ෆැක්ස්, විදුලි සීනුව, අනතුරු ඇඟවීමේ සංඥා

හතරකට ලකුණු 02

III. අ. බලය, මාධ්‍යය, මාර්ගය, පර්යන්තය

ලකුණු 02

ආ. ගුරු අත්පොත 191 පිටුවේ පිළිතුරු ඇත.

වාසි 02 ට ලකුණු 01

අවාසි 02ට ලකුණු 01

IV. 1. මෝටර් රථ ලියා පදිංචි කළ යුතුවීම

2. වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනීම

3. රක්ෂණ සහතික ලබා ගැනීම

4. අදාල අවස්ථාවලදී යෝග්‍යතා සහතික ලබාගැනීම

5. රියදුරු බලපත්‍ර ලබාගත යුතුවීම

6. මාර්ග නීතිරීති පිළිපැදිය යුතුවීම.

(ලකුණු 02)

ආ. 1. ඉන්ධන මිල ඉහළයාම හා ඊට සාපේක්ෂව ගාස්තු ඉහළ නැංවීමේ ගැටළු

2. විවිධ බලපත්‍ර ගාස්තු හරහා පළාත් පාලන ආයතන අය කරනු ලබන ගාස්තු ඉහළ යාම

3. මාර්ග අබලන් වීම

4. මාර්ග තදබදය

5. නඩත්තු වියදම් ඉහළයාම (ලකුණු 02)

V. අ. භාණ්ඩයේ ස්වභාවය, පිරිවැය, වේගවත් බව, දුර ප්‍රමාණය, ධාරිතාව, සුරක්ෂිත බව, ප්‍රමිතීන්ට අනුකූල බව, ලබා ගැනීමේ පහසුව

(1/2 × 4 ලකුණු. 02)

ආ. අධිවේගී මාර්ග, ගුවන් පාලම්, විදුලි මෝටර් රථ, උමං මාගී, පරිසර හිතකාමී ශක්ති ප්‍රභේද යොදා ගැනීම.

(1/2 × 4 ලකුණු. 02)

07. I. 1. සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වාගැනීමට.

2. වෙළඳ ගණුදෙනුවකදී අදාල පාර්ශව අතර අදහස් හුවමාරු කර ගැනීමට.

3. මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය කිරීමට

4. අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා.

ආ. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග.

යවන්නා.

පණිවුඩය.

මාධ්‍ය.

ලබන්නා.

ප්‍රතිපෝෂණය.

ප්‍රතිචාරය. (කරුණු 06 ට ල.02)

I. අ) 1. ලිඛිතව සන්නිවේදනය කිරීමේ වාසි .

වාසි

1. පණිවුඩය දුන්බවට සාක්ෂි තිබීම.

2. නැවත නැවත භාවිතා කළ හැකි විම.

3. පණිවුඩය කෙටිකර ඉදිරිපත් කළ හැකි වීම.

අවාසි

1. පිරිවැය අධික වීම

2. ලිවීම කියවීම නොදන්නා අයට භාවිතා කළ නොහැකි වීම.

3. භාෂා සම්බන්ධව අපහසුතා ඇතිවීම.

(වාසි 02 ට ල. 01)

(අවාසි 02 ට ල. 01)

ආ) ඉන්ටර් කොම්,හඬතැපැල, ගුවන් විදුලිය, විද්‍යුත් දැන්වීම් පුවරු , ඊමේල්, ෆැක්ස් , විදුලි සීනුව , අනතුරු ඇඟවීම් සංඥා.

(කරුණු 04 ට ල.02)

III. අ. බලය, මාධ්‍යය, මාගීය, පර්යන්තය (ල. 02)

ආ. ගුරු අත්පොත් 191 පිටුවේ පිළිතුරු ඇත.

(වාසි 02 ට ල. 01)

(අවාසි 02 ට ල. 01)

IV. අ. 1. මෝටර් රථ ලියාපදිංචි කල යුතු වීම.

2. වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීම.

3. රක්ෂණ සහතික ලබාගැනීම.

4. අදාල අවස්ථා වලදී යෝග්‍යතා සහතික ලබාගැනීම.

5. රියදුරු බලපත්‍රය ලබාගත යුතු වීම.

6. මාර්ග නීති රීති පිළිපැදිය යුතු වීම.

ආ. 1. ඉන්ධන මිල ඉහළ යාම හා ඊට සාපේක්ෂව ගාස්තු ඉහළ නැංවීමේ ගැටළු.

2. විවිධ බලපත්‍ර ගාස්තු හරහා පලාත් පාලන ආයතනය අයකරනු ලබන ගාස්තු ඉහළ යාම.

3. මාර්ග අබලන් වීම.

4. මාර්ග තදබදය

5. නඩත්තු වියදම් ඉහළයාම.

V. අ. භාණ්ඩයේ ස්වභාවය, පිරිවැය, වේගවත් බව, දුර ප්‍රමාණය, ධාරිතාව, සුරක්ෂිත බව ප්‍රමිතීන්ට අනුකූල බව.

1/2 x 4 ල. 02

ආ. අධිවේගි මාගී

ගුවන් පාලම්


විදුලි මෝටර් රථ

උමං මාගී

පරිසර හිතකාමී ශක්ති ප්‍රබේද යොදා ගැනීම.

1/2 x 4 ල. 02

08. I. (අ) වෙළඳාම




නිවැරදි පිළිතුරට ලකුණු 02

(ආ) **පාරිභෝගිකයාට**

1. ණයට භාණ්ඩ ලබාගත හැකිවීම

2. නව භාණ්ඩ හඳුන්වා දීම හා අවශ්‍ය අවස්ථා වලදී උපදෙස් ලබාදීම.

3. පාරිභෝගික අවශ්‍යතා අනුව විවිධ වර්ගයේ භාණ්ඩ සැපයීම.

පාරිභෝගිකයාට විවිධ පහසුකම් සැපයීම.

(1/2 × 2 ලකුණු. 01)

**නිෂ්පාදකයාට**

1. නිෂ්පාදකයාගේ නව නිෂ්පාදන පාරිභෝගිකයාට හඳුන්වා දීම.

2. භාණ්ඩ ප්‍රවර්ධනයට සහභාගිවීම.

3. තොග වෙළඳ කටයුතු ප්‍රවර්ධනයට දායකවීම. (1/2 × 4 ලකුණු. 02)

II. 1. සුපිරි වෙළඳ සැල් රට පුරා ව්‍යාප්තව පැවතීම

2. විවෘතව තබන වේලාවල් දීර්ඝ වීම

3. නව තාක්ෂණය භාවිතා කිරීම

4. ගම්බද ප්‍රදේශවල ද සුපිරි වෙළඳ සැල් ක්‍රියාත්මක වීම.

5. සේවා සැපයුම් සමග සිල්ලර වෙළඳ සැල් සම්බන්ධ වීම.

6. වෙළඳ සැල් රහිත වෙළඳාම ව්‍යාප්ත වීම.

7. ස්වයංක්‍රීය විකුණුම් යන්ත්‍ර මගින් අලෙවිය.

(1 × 4 ලකුණු. 04)

III. (අ) 1. රෙදිපිළි හා ඇඟළුම්

2. රබර් නිෂ්පාදන

3.ඛනිජ තෙල් නිෂ්පාදන

4. මැණික් දියමන්ති හා ස්වර්ණාභරණ

5. ආහාර පාන වර්ග හා දුම්කොළ

6. යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ

7. ප්‍රවාහන උපකරණ

8. සම්භාණ්ඩ හා සංචාරක භාණ්ඩ

9. පිඟන් මැටි නිෂ්පාදන

10. මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන

(1/2 × 4 ලකුණු. 02)

(ආ) 1. සහල්

2. සීනි හා රසකැවිලි

3. කිරි නිෂ්පාදන

4. පරිප්පු

5. රථවාහන

6. බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදන

7. ගෘහ උපකරණ
8. රෙදිපිළි හා උපාංග

(1/2 × 4 ලකුණු 02)

IV.
1. රටතුළ නිපදවිය නොහැකි භාණ්ඩ පරිභෝජනය කළ හැකිවීම.
2. දේශීය සම්පත් උපරිම ආකාරයට නිෂ්පාදනයට යොදවා ගත හැකිවීම.
3. තත්ත්වයෙන් හා ගුණත්වයෙන් ඉහළ භාණ්ඩ ලබා ගැනීමට හැකිවීම.
4. රට රටවල් අතර මිත්‍රත්වය වර්ධනය වීම තම රටේ අතිරික්ත නිෂ්පාදනවලට වෙළඳපලක් ලබාගත හැකිවීම.

(1 × 4 ලකුණු 04)

V. **ව්‍යාපාරිකයාට**

1. ගනුදෙනුව ඉතා වේගවත්ව සිදුවීම.
2. තම වෙළඳපොළ පුළුල් පරාසයකට ක්‍රියාත්මක වීම
3. පාරිභෝගික ප්‍රතිචාර සෘජුව ලබා ගැනීමට හැකිවීම. (1 × 2 ලකුණු. 02)

**පාරිභෝගයාට**

1. භාණ්ඩ තෝරා ගැනීමට පුළුල් ඉඩකඩක් හිමිවීම.
2. ඉක්මනින් භාණ්ඩ ඇණවුම් කිරීම හා ලබා ගැනීමට ඇති හැකියාව
3. අදාළ නිෂ්පාදයාට බොහෝ දුරට සම්බන්ධ වීම. (1 × 2 ලකුණු. 02)

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




- Past Papers
- Model Papers
- Resource Books

for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

# 071 777 4440